# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.09 පැය 1900 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/693/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් නිලධාරීන්ගේ යහපත් රාජකාරී ඇගයීම සඳහා මුදල් ත්‍යාග ප්‍රධානය කිරීම.**

කැළණිය සහ ගම්පහ යන කොට්ඨාසයන්හී අපරාධ විසඳීම සඳහා සුවිශේෂී දායකත්වයක් දක්වන ලද නිලධාරීන් වෙනුවෙන් ත්‍යාග මුදල් පිරිනැමීමේ උත්සවයක් බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධම්මරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් බස්නාහිර පළාත උතුර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත ලියනගේ මහතාගේ සහභාගීත්වයෙන් 2025 අප්‍රේල් මස 09 වන අද දින උදෑසන ජාඇල පොලිස් වසමේ ඒකමුතු උත්සව ශාලාවේදී පවත්වන ලදි.

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය සහ බස්නාහිර පළාත් උතුර රථවාහන කොට්ඨාසය ඇතුළුව කැළණිය කොට්ඨාසයේ පොලිස් ස්ථාන 13 කට අනුයුක්තව රාජකාරී කරනු ලබන නිලධරයන් 75 දෙනෙකු සඳහා රුපියල් 12,916,300/= ක ත්‍යාග මුදලක්ද, ගම්පහ කොට්ඨාසයේ පොලිස් ස්ථාන 18 කට අනුයුක්තව රාජකාරී කරනු ලබන නිලධරයන් 54 දෙනෙකු සඳහා රුපියල් 15,509,437.50 ක ත්‍යාග මුදලක් ප්‍රදානය කරන ලදී.

මෙම ත්‍යාග මුදල් සඳහා පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන්, පොලිස් සැරයන්, කාන්තා පොලිස් සැරයන්, පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් කොස්තාපල්වරියන්, පොලිස් සැරයන් රියදුරු සහ පොලිස් කොස්තාපල් රියදුරු නිලධාරීන් සුදුසුකම් ලබා ඇත.

මෙම අවස්ථාව සඳහා කැලණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නුවන් අසංක මහතා, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජගත් රෝහණ මහතා හා මීගමුව කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අශෝක ධර්මසේන මහතා ඇතුළු පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්






















**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**